# පුරවැසි සභාව



**පුරවැසි සභාව**

ප්‍රථම මුද්‍රණය 2014 මැයි

ISBN 978-955-4746-31-2

පරිගණක නිමැවුම : **වාකයා රූ** 011-2708377

මුද්‍රණය : **ග්ලෝබ් ප්‍රින්ටින් වර්ක්ස්** 011 2329739

ප්‍රකාශනය :

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**
24/2, 28 වෙනි පටුමග, මල් පාර, කොළඹ 07,
දුරකථනය 94-11-2565304/06
ෆැක්ස් 94-11-4714460
ඊ-මේල් cpa@cpalanka.org
වෙබ් www.cpalanka.org

**மாற்றுக்கொள்கைகளுக்கான நிலையம்**
24/2, 28வது ஒழுங்கை,
ஃப்ளவர் வீதி, கொழும்பு-7
தொ.பே : 0112 370801/3
ஈமேல் : cpa@cpalanka.org
www.cpalanka.org

## පටුන


අදහස් රැසක් - එක සම්මුතියක් **5**

විෂය පථය හා වගකීම **9**

පුරවැසි කමිටු විෂය ක්ෂේත්‍රය - පරිසරය සහ මිනිසා **13**

යහ පාලනය **15**

මානව ගරුත්වය, භාෂාව හා සංස්කෘතික විවිධත්වය **17**

තරුණ නියෝජනය **20**

ළමා හා කාන්තා **22**

පුරවැසි සභා ව්‍යවස්ථාව සම්බන්ධයෙන් මූලික කෙටුම්පතක් **23**

## අදහස් රැසක් - එක සම්මුතියක්

ජන ජීවිතයට අදාළ වන සියලු ආයතන සමාජ, ආර්ථික හා දේශපාලන සාධාරණත්වය ගුරු කොට ගන්නා සමාජ ක්‍රමයක් ඇති කිරීම සඳහා බැඳී සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 (2) (අ) ව්‍යවස්ථාවෙහි දැක්වේ. මීට අමතර ව විවිධ ගැසට් පත්‍ර හා අණ පනත් මගින් ද පුරවැසි අයිතීන් තහවුරු කර ඇත. එහෙයින් මෙය පුරවැසියන් සතු අනුල්ලංඝනීය අයිතිවාසිකමකි. මේ අයිතිවාසිකම් නිසි අයුරින් නො ලැබෙන විට සක්‍රීය ව ඒ සඳහා මැදිහත් වෙමින් ඒවා දිනා ගැනීමට කටයුතු කිරීම පුරවැසියා සතු වගකීම ය. මේ සක්‍රීය වීම විවිධ මට්ටමින් විය හැකි ය. එය බිම් මට්ටමේ සිට ක්‍රියාත්මක වීම සඳහා පුරවැසියන් සතු වගකීම කුමක් ද යන්න පිළිබඳ කතිකාවතක් අවශ්‍ය වේ.

රටේ පුරවැසියන් හැටියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති අයිතිවාසිකම් කවරේ ද යන්න පිළිබඳ මඳ අවබෝධය නිසා, ගම්මු බොහෝ විට තමන්ට අහිමි වන වරප්‍රසාද හෝ අයිතිවාසිකම් පිළිබඳ වගකීම කරුමයට බාර දෙති; ලබා උපන් හැටි යනුවෙන් ප්‍රකාශ කරති; අදෘශ්‍යමාන බලවේගවල පිහිට පතති. මෙය පිරිහුණු රාජ්‍ය තන්ත්‍රයක පැවතීම තව දුරටත් තහවුරු කරමින් මහජන නියෝජිතයන්ට හා රාජ්‍ය නිලධාරීන්ට තම වගකීම පැහැර හැරීමේ සාධාරණ පසුබිමක් ද නිර්මාණය කරයි. ඇතැම් විට පූජක සංස්ථාව ද මේ තත්ත්වය ඉවසනු පෙනේ. පුරවැසියාගේ පාර්ශ්වයෙන් බලන කල්හි මෙය අතිශය කනගාටුදායක තත්ත්වයකි. එවැනි සමාජ පරිසරයක ප්‍රඥාව හා විචාරය වෙනුවට අවිද්‍යාව, කළකිරීම රජයයි.

මෙය සමාජයේ ඉදිරි ගමනට බලවත් බාධාවකි. නිදහස ලබා වසර 60 ගණනක් ගත වී තිබියදීත් දියුණු පුරවැසි සමාජයක් ගොඩ නඟා ගැනීම මන්දගාමී වී තිබේ. මේ නිසා එකිනෙකාට ගරු කිරීම, සම්පත් බෙදා හදා ගැනීම, සහජීවනය, සහනශීලී පැවැත්ම සහ සමාජ උන්නතිකාමී ඉදිරි දැක්මක්



තිබීම අර්බුදයට ගොස් පවතී. මිහි මත වෙසෙන් මිනිසා ඇතුළු ගහකොළ සතා සීපාවාට ද අහසෙහි සරන පක්ෂීන්ට ද චිරන්තන සම්ප්‍රදායයන් මඟින් තහවුරු කරන ලද ජීවත් වීමේ අයිතිය හා සමානාත්මතාව පිළිබඳ දර්ශනය විවිධ හේතු මත යටපත් කර ඇත.

කුමන සංවර්ධන සැලසුම් ඉදිරිපත් කළත් ඒවා පල නො දරන්නේ මේ අවාසනාවන්ත තත්ත්වය හේතුවෙනි. පුරවැසි සභාව නිර්මාණය වනුයේ එබඳු කතිකාවතක ප්‍රතිපලයක් හැටියට ය.

රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන පරිපාලනමය හා සංවර්ධන කටයුතු කුමන ව්‍යුහයක් යටතේ ක්‍රියාත්මක වුව ද, ඒවා 'ගම' නමැති ඒකකය මුල් කර ගනී. මෙහි දී පාර්ශ්ව තුනක් ක්‍රියාත්මක වේ.

එනම්

- ගැමි ප්‍රජාව
- සේවා ආයතන සහ
- රජය යි.

රජය සහ ගැමි ග්‍රජාව අතර සම්බන්ධය ගොඩ නැගෙන්නේ සේවා ආයතන ඔස්සේ ය. එහෙත් මෙය නිසි පරිදි ක්‍රියාත්මක නොවන්නේ විවිධ ව්‍යාකූලතා හේතුවෙනි. ඒවා හඳුනා ගැනීම සහ අවශ්‍ය පිළියම් යෙදීමේ ශක්‍යතාවක් පුරවැසි සභාවනට පවතී.

## විෂය පථය හා වගකීම

1. ගමට සේවා සැපයෙන ආයතන ව්‍යූහයන් හඳුනා ගැනීම
2. එම සේවා සැපයීමේ මන්දගාමිත්වයක් හෝ ව්‍යාකූලතාවක් හෝ පවතී නම් ඊට හේතු හඳුනා ගැනීම හා අවශ්‍යතා පරිදි මැදිහත් වීම
3. එම සේවා ක්‍රියාත්මක වීමේ දී අල්ලස් හෝ දූෂණ හෝ සිදු වේදැයි අවධියෙන් සිටීම
4. ක්‍රියාත්මක වන සේවා ගැමි සමාජයෙහි චිරන්තන සම්ප්‍රදායයන්ට හානියක් වන පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබඳ සුපරීක්ෂාකාරී වීම
5. ක්‍රියාත්මක වන සේවා ගමේ පරිසර පද්ධතියට හානියක් කරයි ද නැද්ද යන්න පිළිබඳ අවදියෙන් සිටීම හා ජනතාව ඒ පිළිබඳ දැනුවත් කිරීම
6. සේවා ලැබීමේ දී විෂමතා සිදු වේ ද යන්න විමසිලිමත් වීම

7. සේවා ලැබීමේ දී සිදු වන අක්‍රමිකතාවලට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා ගැමි ප්‍රජාව දැනුවත් කිරීම හා අවශ්‍ය සහයෝගය ලබා දීම

8. රාජ්‍ය ආයතන සහ ගැමි ප්‍රජාව අතර පහසුකාරකයකු වෙමින් එම සේවාවල උපරිම ප්‍රගතිය ගමට අත්පත් කර දීම

9. ගැමි ප්‍රජාව අතර ද්විභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දායකත්වය සැපයීම

10. සහජීවන පැවැත්මට බාධා කරන කණ්ඩායම්වල ක්‍රියාකාරිත්වය තුනී කිරීම සඳහා ගැමි ප්‍රජාව මානසිකව බල ගැන්වීම

11. සංස්කෘතික විවිධත්වය ඉවසීමේ මඟ පෙන්වීම

12. ගැමි ප්‍රජාවගේ අධ්‍යාපන හා සෞඛ්‍ය ඌනතා වැනි විවිධ ගැටලු හඳුනාගෙන විකල්ප යෝජනා ඉදිරිපත් කිරීම

13. ගමට අදාළ වන සංවර්ධන සැලසුම් ඉදිරිපත් කිරීම

14. ප්‍රදේශයට ආවේණික වූ ජන කලා සහ සාහිත්‍යාංග ප්‍රවර්ධනය කෙරෙන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම හා පවත්වා ගෙන යෑම

15. සොබාදහම සහ මිනිසා අතර තිරසාර පැවැත්ම තහවුරු කෙරෙන පරිදි කාබනික ගොවිතැන, ඒකාබද්ධ ජෛව පාලනය සහ වස විසෙන් තොර ආහාර සංස්කෘතියක් සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සිදු කිරීම

16. පුරවැසි සභාව කිසි සේත් ම රාජ්‍ය විරෝධී සංවිධානයක් නොවනු ඇත.

17. පුරවැසි සභාව කවර රජයක් යටතේ දී වුව ද පුරවැසියාට ලැබිය යුතු අයිතිවාසිකම් පිළිබඳ සංවේදී වෙමින් කටයුතු කරනු ඇත.

18. ඕනෑ ම දේශපාලන පක්ෂයකට අයත් පුරවැසියකුට පුරවැසි සභාව නියෝජනය කළ හැකි ය.

19. රාජ්‍ය ආයතන මඟින් ක්‍රියාත්මක කෙරෙන ඇතැම් සේවා අඩාල වීමේ දී පුරවැසි සභාවේ මැදිහත් වීම රජය අපහසුතාවකට පත් කිරීම සඳහා නොව මහජන සේවා පහසුවෙන් ලබා දීම සඳහා කෙරෙන නම්‍යශීලී මැදිහත් වීමකි.

20. පුරවැසි සභා වාර්ෂික වාර්තාව වසරක් තුළ එහි ක්‍රියාකාරකම්, ඒවායෙහි ප්‍රගතිය හා දුබලතා, මූල්‍ය ගනුදෙනු විමර්ශනයට ලක් කරයි.

21. පුරවැසි සභාව ක්‍රියාත්මක වීමේ දී විවිධ පාර්ශ්ව විවිධ අයුරින් ප්‍රතිචාර දැක්විය හැකි ය. ඇතැම් ප්‍රතිචාර තරමක් රළු ඒවා වන්නට ද පුළුවන. එහෙත් පුරවැසි සභා නායකත්වය හා ක්‍රියාකාරිකයන් එබඳු අවස්ථාවල දී කටයුතු කළ යුත්තේ අහිංසාවාදී ව හා දැඩි හික්මීමකින් යුක්ත ව ය.



# පුරවැසි කම්ටු විෂය ක්ෂේත්‍රය

## පරිසරය සහ මිනිසා

1. ගම තුළ සිදු කෙරෙන කෘෂිකර්ම, පශු සම්පත් හා ධීවර යනාදී කටයුතුවල ස්වභාවය, එහි ප්‍රතිලාභ, ගැමි දිවියට එයින් සිදු වී ඇති ප්‍රගතිය සහ අගතිය සාකච්ඡා කිරීම

2. ගමෙහි භූගෝලීය සහ සමාජීය පරිසරයට උචිත කෘෂි වගාවන් පිළිබඳ අවධානය

3. කෘෂි රසායන භාවිතයෙන් ඇති හානිය අව ම කර ගැනීම සඳහා ඒකාබද්ධ ජෛව පාලනයට හා කාබනික වගාවන්ට හුරුවක් ඇති කිරීම

4. කෘෂි නිෂ්පාදනය, අලෙවිය සහ භාවිතය විෂයෙහි ඇති ගැටලු සාකච්ඡා කිරීම සහ විකල්ප ක්‍රමවේද හඳුනා ගැනීම

5. දේශීය ඔසු පැළෑටි සංරක්ෂණය, ප්‍රවර්ධනය හා තිරසාර භාවිතය පිළිබඳ අවධානය යොමු කිරීම

6. ගමෙහි වෘක්ෂලතා පද්ධති ආරක්ෂා කෙරෙන හා ප්‍රවර්ධනය කෙරෙන වැඩ සටහන් ආරම්භ කිරීම

උදා: පාසලට දරුවකු බාර දෙන විට පැළයක් තිළිණ කිරීම හා එම දරුවා පාසලෙන් ඉවත් වන තුරු සිට වූ පැළය ආරක්ෂා කිරීම

7. පරිසර සමතුලිතතාව බිඳ වැටීම නිසා ඇති වී තිබෙන ගැටලු පිළිබඳ කතිකාවතක් ගොඩ නැගීම

උදා: පතල් කැණීම, වැලි ගොඩ දැමීම, කසළ මුදා හැරීම, කැළෑ ගිනි තැබීම

8. ජෛව විවිධත්වයට හානි කෙරෙන ප්‍රවණතා හඳුනා ගැනීම, දේශීය බීජ, ජල මූලාශ්‍ර, සත්ව හා ශාක ගහනවල පැවැත්ම හා අයිතිය සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු හඳුනා ගෙන ඒවා වැලැක්වීම සඳහා සක්‍රීය ව දායක වීම



## යහ පාලනය

1. ගමට සේවා සපයන ආයතන සහ ඒවායින් ලැබිය යුතු සේවා අර්ථකථනයක් කිරීම

ඒවා නම්

පොලීසිය, ප්‍රාදේශීය ලේකම්, පවුල් සෞඛ්‍ය සේවය, ග්‍රාම නිලධාරී, ගොවි ජන සේවා නිලධාරී, සමෘද්ධි නියාමක, වතු අධිකාරී, ධීවර සමිති, කාන්තා සංවිධාන, මරණාධාර සමිති, ත්‍රී රෝද සංගමය, ආගමික සංවිධාන, මහජන සෞඛ්‍ය පරීක්ෂක, පළාත් පාලන ආයතන, පළාත් සභා සහ මධ්‍යම ආණ්ඩුව

2. එම ආයතනවලින් ලැබෙන සේවා නිසි පරිදි ලැබේ ද?

3. සේවා සපයන්නා සහ සේවා ලාභියාගේ පාර්ශ්වයෙන් සිදු වන අඩු පාඩු මොනවා ද?

4. ඒවා මඟ හරවා ගත හැක්කේ කෙසේ ද?

මේ පිළිබඳ කතිකාවතක් ගොඩ නඟා අවශ්‍ය මැදිහත් වීම් කිරීම

## මානව ගරුත්වය හා භාෂාව හා සංස්කෘතික විවිධත්වය

1. ගම තුළජීවත් වන විවිධ කුල වෘත්තීය මට්ටම්, ආගම් සහ ජාතීන්ට අයත් ජන වර්ගවලට වෙනස් කොට සැලකීමේ ප්‍රවණතා හඳුනා ගැනීම සහ ඒවා වැලැක්වීම සඳහා ක්‍රියාත්මක වීම

2. සර්ව ආගමික වැඩ සටහන්, ආගමික හුවමාරු වැඩ සටහන්, සියලු ආගම්වල හරයන් ඉස්මතු කෙරෙන කතිතාවක් දියත් කිරීම

සංස්කෘතිය යනු මිනිසා නිර්මාණය කළ සම්පත් සාධාරණ ව බෙදා හදා ගෙන තෘප්තිමත් ව ජීවත් වීම ය.සංස්කෘතික ජීවිතයක් අහිමි වීම යනු අතෘප්තියෙන් ජීවත් වීමකි.

1. භාෂා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සංස්කෘතික දායාද ආරක්ෂණය හා ප්‍රවර්ධනය



ඕනෑම ගමක පොදු සංස්කෘතික සම්පත් මෙන් ම ගමට ආවේණික වූ සංස්කෘතික දායාද පවතී. පාරම්පරික කලා පවතී. පාරම්පරික නිර්මාණ ශිල්පීහු ජීවත් වෙති.ඔවුන්ට තම ශිල්පය අනුව අභිමානයෙන් ජීවත් විය හැකි පරිසරයක් ගොඩ නැඟීම

2. එම ශිල්ප කලා වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ වෘත්තීය මට්ටම නැංවීම සඳහා

අදාළ ආයතන ද සම්බන්ධ කර ගෙන ක්‍රියාකාරී වැඩ පිළිවෙළකට යා යුතු ය.

3. ගැමි ජනයාගේ රසවින්දනය නැංවීම සඳහා සාහිත්‍ය කලා, දෘශ්‍ය කලා සහ ජන කලා ආශ්‍රිත සංකථන ක්‍රියාත්මක කළ යුතු ය.

4. පුරවැසිසභාවක් සක්‍රීය ව ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් වන ලේඛන,පත පොත,සාහිත්‍ය කෘති, සිනමා හා ටෙලි නාට්‍ය ඩී.වී.ඩී. තැටි ඇතුළත් ක්‍රමානුකූල පොත් රාක්කයක් පවත්වා ගෙන යෑමට කටයුතු කිරීම

5. ජංගම පුස්තකාලයක් ආරම්භ කිරීම

## තරුණ නියෝජනය

1. තරුණ ප්‍රජාවට වැදගත් වන ගමට ආවේණික වූ තත්ත්වයන් ද පොදු තත්ත්වය ද සමාලෝචනය කිරීම

2. තරුණයන් විචාරවත් කිරීම



3. තරුණයන්ගේ නිර්මාණශීලී දායකත්වය ගමේ සංවර්ධනය සඳහා යොදා ගැන්ම

4. සැලසුම් කිරීමේ දී හා තීන්දු ගැනීමේ දී තරුණ දායකත්වය ලබා ගැනීම

5. තරුණයන්ගේ කුසලතා සහ නව නිපැයුම් සංවර්ධනය කිරීමේ අවස්ථාව ලබා දීම

6. පොදු වැඩ සටහන්වල දී තරුණ දායකත්වය ලබා ගැනීම

7. ගවේශනය, විමර්ශනය හා දත්ත රැස් කිරීම සඳහා තරුණ කමිටු පිහිටුවීම



## ළමා හා කාන්තා

1. ගමෙහි භූගෝලීය හා සමාජ පරිසරය අනුව විශේෂයෙන් කාන්තාවන්ට, විශේෂ අවශ්‍යතා ඇති අයට සහ දරුවන්ට අවශ්‍ය සේවාවන් හා සුබ සාධන සේවා හඳුනා ගැනීම

2. දරුවන්ට දරුවන්ගේ ජීවිතය ලබා දීම

3. දරුවන් හා කාන්තාවන් ගමෙහි සමාජ සංවර්ධන කටයුතු සඳහා දායක කර ගැනීම

4. කාන්තා හා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

5. කාන්තාවන්ගේ අත්කම් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, දිරි ගැන්වීම සඳහා කටයුතු කිරීම

6. නොමිලේ සෞඛ්‍ය, පෝෂණ හා මනෝ සෞඛ්‍ය සායන පැවැත්වීමට කටයුතු කිරීම

## පුරවැසි සභා ව්‍යවස්ථාව සම්බන්ධයෙන් මූලික කෙටුම්පතක්

1. සංවිධානයේ නමඃ ................................................

2. ලිපි ........................................................................

   ........................................................................

3. දිස්ත්‍රික්කයඃ ...........................................................

4. ප්‍රා. ලේකම් කොට්ඨාසය ..................................

5. දැක්මඃ විචාරවත් සක්‍රීය පුරවැසි සමාජයක්

6. මෙහෙවරඃ පුරවැසියන්ගේ සක්‍රීය දායකත්වය ලබා ගනිමින් හා ඔවුන්ගේ සම්මුතියෙන් ප්‍රජාතන්ත්‍රවාදය, යහ පාලනය, සහජීවනය සහ සමාජ, ආර්ථික, සංස්කෘතික වර්ධනය තහවුරු කිරීම

7. අරමුණු:

1. ගම නමැති ඒකකය තුළ පුරවැසියාගේ භූමිකාව අර්ථවත් කිරීම

2. පුරවැසියාගෙන් සමාජයට ඉටු විය යුතු වගකීම සහ කාර්යභාරය පුළුල් කිරීම

3. පුරවැසියන්ගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා පිහිටුවා ඇති ආයතන ව්‍යූහයන්හි

සබලතා හා දුබලතා හඳුනා ගනිමින් ඒවා යථාවත් කිරීම සඳහා පුරවැසියා ශක්තිමත් කිරීම

4. නිර්මාණශීලී, ප්‍රඥාසම්පන්න, විචාරවත් පුරවැසියකු බිහි කිරීම

8. ගම තුළ භෞතික හා මානව සම්පත් සංවර්ධන සඳහා පුරවැසියාගේ දායකත්වය ලබා ගනිමින් එහි ආර්ථික හා සමාජ ප්‍රතිලාභ ඔස්සේ ගැමි දිවිය ප්‍රබෝධවත් මඟකට ගැනීම

9. ගමට අදාළ සියලු කාර්යයන්හි දී ද්වි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත් වීම

## 10. සාමාජිකත්වයඃ

1. අදාළ ග්‍රාම නිලධාරී වසම තුළ පදිංචිකරුවකු විය යුතු ය.

2. පුරවැසි සභාවේ වැඩ පිළිවෙළ හා එහි ක්‍රියාකාරිත්වය සමඟ එකඟ වන්නකු විය යුතු ය.

3. සාමාජිකත්වය අපේක්ෂා කරන්නා කුමන හෝ ස්වේච්ඡා සංවිධානයක සාමාජිකයකු විය යුතු ය.

4. කිසි ම ස්වේච්ඡා සංවිධානයක සාමාජිකයකු නොවන අයකු සාමාජිකත්වය ලබාගැනීමේ දී සමාජ ක්‍රියාකාරකයකු හැටියට ස්වේච්ඡා සංවිධාන දෙකක යෝජනා ස්ථිරත්වයෙන් යෝජනා වීම අපේක්ෂා කෙරේ.

5. ස්වේච්ඡා සංවිධානයක කිසියම් සාමාජිකයකුගේ සාමාජිකතවය අත්හිටු වූ මොහොතක පුරවැසි සභාවේ සාමාජිකත්වය ද අහෝසි වේ. එහි දී පුරවැසි සභාවට අයත් ස්වේච්ඡා සංවිධාන සභාවට අයත් ස්වේච්ඡා සංවිධාන දෙකක යෝජනා

ස්ථිරත්වයෙන් ඔහුට නැවත සාමාජිකත්වය ලැබීමේ අවස්ථාව හිමි වේ.

6. පුරවැසි සභාවේ ව්‍යවස්ථාව උල්ලංඝනය කරන සාමාජිකයකු උපදේශක සභාවේ විනය කමිටුව මඟින් වැරදිකරුවකු බවට තීන්දු කළ විට ඔහුගේ සාමාජිකත්වය අහෝසි කෙරේ.

7. මහා සභා රැස්වීම් තුනකට පිට පිට සහභාගි නොවූ සාමාජිකයකුගේ සාමාජිකත්වය අහෝසි කෙරේ.

## 11. විධායක සභාවඃ

1. පුරවැසි සභාවේ සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික, කාරක සභා සාමාජිකයයෝ, අනු කමිටුවල සභාපති හෝ ලේකම්වරු විධායක සභාව නියෝජනය කරති.

2. පුරවැසි කමිටුවල කාර්යභාරය නිරීක්ෂණය, පසු විපරම, ඇගයීම හා අවශ්‍ය අවස්ථාවන්හි දී උපදෙස් දීම විධායක සභාවේ වගකීම ය.

3. විධායක සභාව විසින් විශේෂ තීන්දු ගැනීමේ දී මහා සභාව කැඳවිය යුතු ය.

4. පුරවැසි සභාවේ සංවර්ධන සැලසුම් පළාත් පාලන ආයතන, පළාත් සභා හා මධ්‍යම ආණ්ඩුවට යොමු කරනුයේ විධායක සභාව විසිනි.

5. විධායක සභාවේ සාමාජිකයන් වාර්ෂික ව තෝරා පත් කර ගැනේ.

12. උපදේශක සභාවඃ

1. සංයුතියඃ ග්‍රාම නිලධාරී, විදුහල්පති, ආගමික නායකයන්, සාම විනිසුරුවරුන් සහ විධායක සභාව විසින් යෝජනා කරනු ලබන ප්‍රභූවරුන් මෙහි සංඛ්‍යාව විධායක සභාව මඟින් තීන්දු කළ හැක.

2. උපදේශක සභාව පත් කරනු ලබන්නේ විධායක සභාව විසිනි.

3. විධායක සභාවට අවශ්‍ය මඟ පෙන්වීම සහ එහි කටයුතු අධීක්ෂණය උපදේශක සභාවේ වගකීම යි.

4. පුරවැසි සභාවේ සාමාජිකයකුගේ ව්‍යවස්ථා විරෝධී හා විනය විරෝධී හැසිරීම් පිළිබඳ විමර්ශනය කර ගන්නා තීන්දු විධායක සභාවට දැනුම් දෙන්නේ උපදේශක සභාව විසිනි.

5. ගැටුම් සමථනයේ දී මෙය සමථ මණ්ඩලයක් හැටියට කටයුතු කරයි.

13. ව්‍යූහය හා පිහිටු වීමඃ

1. එක ග්‍රාම සේවා වසමකට එක පුරවැසි සභාවක් පිහිටුවනු ලැබේ.

2. වසමෙහි විශාලත්වය හා භූගෝලීය පිහිටීම මත ගම්මාන සහ ගම්මණ්ඩිවල අවශ්‍යතාව අනුව අනු කමිටු කීපයක් පිහිටු විය හැකි ය.

14. සාමාජිකයන්ගේ කාර්යභාරයඃ

1. මහා සභා රැස්වීම්වලට අනිවාර්යයෙන් සහභාගි විය යුතු ය.

2. ඕනෑ ම සාමාජිකයකුහට යෝජනා ඉදිරිපත් කළ හැකි ය.

15. මහා සභාව:

1. වසරකට තුන් වරක් රැස් විය යුතු ය.
2. අවම සහභාගිත්වය 25ක් විය යුතු ය.

16. අනු කමිටු:

1. පරිසරය හා මිනිසා
2. යහපාලනය
3. මානව ගරුත්වය, භාෂාව හා සංස්කෘතික විවිධත්වය
4. තරුණ නියෝජනය
5. ළමා හා කාන්තා

සංයුතිය: අව ම වශයෙන් පහක් වත් සිටිය යුතු ය.

අනු කමිටුවේ සභාපති, ලේකම් අනිවාර්යයෙන් සහභාගි විය යුතු ය. අනු කමිටුව ගන්නා තීන්දු අනිවාර්යයෙන් ම මහා සභාවට දැනුම් දිය යුතු ය.

## 17. අරමුදල් රැස් කිරීම හා පරිහරණය

1. පිළිගත් මූල්‍ය රෙගුලාසි අනුව කටයුතු කළ යුතු ය.

2. විධායක සභාව විසින් නම් කරනු ලබන ආයතනයක් විසින් මූල්‍ය විගණනය කළ යුතු ය.

3. උපදේශක සභාවේ අවසරය ඇති ව අරමුදල් රැස් කිරීමේ බලය අනු කමිටුවට පවතී.

4. රාජ්‍ය හා රාජ්‍ය නො වන ආයතනවලින් ලබා දෙන මූල්‍ය පරිත්‍යාග ලබා ගැනීමේ බලය පවතී.

5. එමෙන් ම පුරවැසි සභාවේ අරමුණුවලට පටහැනි නොවන විවිධ ක්‍රියාකාරකම් තුළින් අරමුදල් රැස් කළ හැක.

6. පරිත්‍යාගශීලීන්ගෙන් සහ සුබ පතන්නන්ගෙන් ලැබෙන අරමුදල්වලින්

7. ගිණුමෙන් මුදල් ආපසු ගැනීමේ දී භාණ්ඩාගාරිකගේ අත්සන අනිවාර්ය වේ. මීට

අමතර ව සභාපතිගේ හෝ ලේකම්ගේ යන දෙදෙනාගෙන් එක් අයකුගේ අත්සනක් ද අවශ්‍ය වේ.

18. ලියා පදිංචි කිරීම:

1. නිර්මාණය කරන ලද සියලු පුරවැසි සභාවන් අදාළ බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා ආයතනයක් හැටියට ලියා පදිංචි කළ යුතු ය.

19. රැස්වීම්: අනු කමිටු - අවශ්‍යතාව අනුව රැස් වේ.

විධායක සභාව - මසකට වරක් රැස් වේ.

මහා සභාව - මාස තුනකට වරක් පැවැත් වේ. විශේෂ අවශ්‍යතා අනුව මහා සභාව රැස්වීමේ හැකියාව ඇත.